www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: කප්පාදු වැඩපිලිවෙල ක්‍රියාවට දමනු සඳහා නව කැබිනට් මන්ඩලය පිහිටුවයි

**Sri Lanka: New cabinet installed to implement austerity program**

කේ. රත්නායක විසිනි

2010 අප්‍රේල් 24

අප්‍රේල් 8 පාර්ලිමේන්තු මැතිවරනයෙන් පසුව, ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ ඊයේ නව කැබිනට් මන්ඩලය නම් කල අතර එය වනාහි කම්කරුවන්ගේ ජීවන මට්ටම්වලට එරෙහි දුර දිග යන ප්‍රහාරයක් වනු ඇති වැඩපිලිවෙලක් සඳහා සූදානම් වීමකි. ඔහු පත් කර ඇති කැබිනට් මන්ඩලය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) ඉල්ලා සිටින කප්පාදු න්‍යාය පත්‍රය ක්‍රියාවට දැමීම පමනක් නොව වැඩ කරන ජනතාව වෙතින් නොවැලැක්විය හැකි ලෙස එල්ල වන ප්‍රතිරෝධය තලා දැමීම ද ඉලක්ක කරගනු ඇත.

ව්‍යවස්ථාව යටතේ පුලුල් විධායක බලතල භුක්ති විඳින රාජපක්ෂ, පෙර නොවූ විරූ ආකාරයේ අමාත්‍යංශ සංඛ්‍යාවක් සිය අත තබා ගෙන ඇත. ආරක්ෂක හා මුදල් යන ප්‍රධාන තනතුරු මෙන්ම, ජනමාධ්‍ය, වරාය හා ගුවන් සහ මහාමාර්ග යන අංශ සම්බන්ධයෙන් ද ඔහු වගකියනු ඇත. ආරක්ෂක ඇමති ලෙස, රාජපක්ෂ රටේ දැවැන්ත පොලිස් බලකාය ද පාලනය කරයි.

ඔහුගේ බාල සොහොයුරු බැසිල් බලගතු ආර්ථික සංවර්ධන ඇමති තනතුරට පත් කර ඇත. පසුගිය සිවු වසර තිස්සේ ජනාධිපති සිය පාලනය ගෙන ගියේ සිය ඥාතීන්, ජ්‍යෙෂ්ඨ නිලධරයන් හා ජෙනරාල්වරු යන අයගෙන් සමන්විත කට්ටුවක් හරහා වන අතර බැසිල් රාජපක්ෂ එම කට්ටුවේ ප්‍රධාන සාමාජිකයෙක් ලෙස ක්‍රියාකර තිබේ. ඔහු ජනාධිපති උපදේශකයකු, පාර්ලිමේන්තු සම්බන්ධීකාරක නිලධාරියකු හා ආන්ඩුවේ දේශපාලන යටිකුට්ටුකාරයකු ලෙස ක්‍රියාත්මක වී ඇත. ජනාධිපතිගේ වැඩිමහල් සොහොයුරු චමල් බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුවේ මූලික තනතුර වන කතානායක ලෙස පත් කරන ලදි.

සිවු වන සොහොයුරු ගෝඨාභය රටේ ආරක්ෂක ලේකම් ය. එය ඡන්දයෙන් පත් කෙරෙන තනතුරක් නොවන නමුදු, පසුගිය සිවු වසර තිස්සේ එය බොහෝ ඇමති තනතුරුවලට වඩා බෙහෙවින් බලගතු තනතුරක් බවට පත්ව ඇත. ජනාධිපති හා ඔහුගේ සොහොයුරු එක්ව, පසුගිය මැයි මාසයේ දී බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරාජය දක්වා ම එල්ටීටීඊයට එරෙහි වර්ගවාදී යුද්ධයක් ගෙන ගියහ.

කැබිනට් ඇමතිවරු, කැබිනට් නොවන ඇමතිවරු හා නියෝජ්‍ය අමාත්‍යවරු 109කින් සමන්විත කලින් පැවති දැවැන්ත ඇමති මන්ඩලයට වඩා නව කැබිනට් මන්ඩලය කුඩා වන නමුදු, පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) හවුල්කාර විවිධ පක්ෂවලට පගා දීමට රාජපක්ෂට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, නව ඇමති මන්ඩලයට කැබනට් ඇමතිවරු 37ක් හා නියෝජ්‍ය ඇමතිවරු 39ක් ඇතුලත් ය. මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රතිඵල නිරාකරනය වූ පසු තවත් පත් කිරීමට සිදු කෙරෙතැයි බලාපොරොත්තු වේ.

ජී.එල්. පීරිස් විදේශ ඇමති ලෙස පත් කිරීම, එල්ටීටීඊයට එරෙහි යුද්ධයේ දී මිලිටරිය කල අපරාධ පිලිබඳව සීමිත විවේචන සිදු කල එක්සත් ජනපද හා යුරෝපා බලවතුන් සතුටු කිරීමට රාජපක්ෂ ගත් ප්‍රයත්නයක් විය හැකිය. එක්සත් ජනපදය හා යුරෝපා සංගමය රාජපක්ෂගේ සාපරාධී යුද්ධයට සහයෝගය දුන් අතර එහෙත් චීනය වැනි සිය ප්‍රතිවාදීන් අභිබවමින් කොලඹ පාලනය මත වැඩි ආනුභාවයක් අත්පත් කරගැනීමේ ප්‍රයත්නයක් ලෙස ඔවුන් මානව හිමිකම් පිලිබඳ ප්‍රශ්නය ගසාකා තිබේ. යුද්ධය තුල දී, මිලිටරි, මූල්‍ය හා දේශපාලන සහයෝගය සඳහා රාජපක්ෂ බෙයිජිං ආන්ඩුව ට බෙහෙවින් වාරු විය. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලද පීරිස් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මිතුරන් වන බටහිර බලවතුන් වෙත නැඹුරුවූවකු ලෙස සැලකෙයි.

ජනාධිපති රාජපක්ෂ යටතේ ඍජුව ක්‍රියාත්මක වන ජනමාධ්‍ය අමාත්‍යංශයේ නියෝජ්‍ය ඇමති ලෙස මර්වින් සිල්වා පත් කිරීම, මාධ්‍යවලට එරෙහිව තව දුරටත් මර්දන පිලිවෙත් ක්‍රියාවට දමන බවට පැහැදිලි අනතුරු ඇඟවීමකි. පසුගිය සිවු වසර තිස්සේ, ආන්ඩුව යුද්ධය හා සිය පිලිවෙත් පිලිබඳ මොන යම් හෝ සීමිත විවේචනයක් පවා මැඩීමට ක්‍රියාත්මක වී තිබේ. ආන්ඩු-ගැති ඝාතක කල්ලි මාධ්‍යවේදීන් පැහැරගෙන ගොස් හෝ මරා දමා ඇත. සිල්වා සිය මැර ක්‍රියා

සම්බන්ධයෙන් කුප්‍රකටය. 2007 දී, ඔහු රජය සතු රූපවාහිනී ආයතන ප්‍රවිෂ්ටයට කඩා වැදුනු අතර එහි දී ඔහුගේ මැරයෝ ඔහුගේ කතාවක් විකාශනය නොකිරීම සම්බන්ධයෙන් ප්‍රවෘත්ති සංස්කාරකවරයකුට ශාරීරිකව පහර දුන්හ.

මහ මැතිවරනයට පෙරාතුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව, පෙබරවාරියේ දී රාජපක්ෂ මාධ්‍ය අමාත්‍යංශය සියතට ගත්තේය. චීනයේ තාක්ෂනික සහාය භාවිතා කරමින් අන්තර්ජාල වාරනය සඳහා සූදානම් වනු පිනිස ජනාධිපති එම අවස්ථාව යොදා ගත්තේය. ජනවාරියේ ජනාධිපතිවරනයට පසුව විරුද්ධ පක්ෂවලට එරෙහිව ගෙන ගිය මර්දනයේ කොටසක් ලෙස, ආන්ඩුව සම්බන්ධයෙන් විවේචනශීලි වූ වෙබ් අඩවි ගනනාවක් ම අවහිර කරන ලදි. මැතිවරන ව්‍යාපාර දෙකේ දී ම, එජනිස රජය සතු මාධ්‍ය සිය ප්‍රචාරක අවියක් ලෙස විවෘතව ම යොදා ගත්තේය.

රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) කැබිනට් මන්ඩලය තුල ආධිපත්‍යය දරයි. ප්‍රධාන හවුල්කාර පක්ෂවලට දුන් ඇමති තනතුරු මෙසේය:

*ජාතික නිදහස් පෙරමුනේ (ජානිපෙ) නායක විමල් වීරවංශ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් ඇමති ලෙස පත් කර ඇත. ජානිපෙ යනු සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනෙන් (ජවිපෙ) බිඳී ගිය කන්ඩායමකි. මැතිවරනයට තරග කල ජානිපෙ අපේක්ෂකයන් 15න් ආසන දිනා ගත්තේ දෙදෙනෙක් පමනි. ස්වෝත්තමවාදී වාචාලයකු වන වීරවංශ, ජානිපෙට අමතර ජාතික ලැයිස්තු මන්ත්‍රී ආසනයක් නොදීම සම්බන්ධයෙන් රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ප්‍රසිද්ධියේ විවේචනය කලේය.

*ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) චම්පික රනවක විදුලි හා බල ශක්ති ඇමති ලෙස පත් කෙරුනි. ආසන දෙකක් පමනක් දිනා ගත් ජාහෙඋ බෞද්ධ ධූරාවලියේ කොටසක් මත පාදක වන දක්ෂිනාංශික සිංහල අන්තවාදී පක්ෂයකි. ආන්ඩුව ලංකා විදුලි බල මන්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට ද අවසානයේ එය පුද්ගලීකරනය කිරීමට ද එල්ල වන බලපෑමට ලක්ව සිටින අතර වැටුප් වැඩි කරන ලෙස ඉල්ලමින් විදුලි බල කම්කරුවන් සිදු කල කාර්මික ක්‍රියාවන් තහනම් කරනු පිනිස දැනටමත් හදිසි නීති බලතල යොදා ගෙන තිබේ.

*ලංකා කම්කරු කොංග්‍රසයේ (සීඩබ්ලිව්සී) නායක ආරුමුගම් තොන්ඩමන් තමන්ට මුලින් ලැබුනු තනතුර ප්‍රතික්ෂේප කල අතර ඔහුටත් ඇමති තනතුරක් ලැබීමට ඉඩ ඇත. සීඩබ්ලිව්සී වෘත්තීය සමිතියක් වන අතර එය දෙමල කතා කරන වතු කම්කරුවන් අතර දේශපාලන පක්ෂයක් ලෙස ද ක්‍රියාත්මක වේ. පසුගිය වසරේ එය අත්සන් කල පාවාදීමේ වැටුප් ගිවිසුම කෙරෙහි වතු කම්කරුවන් අතර පවත්නා ගැඹුරු වෛරය පිලිබිඹු කරමින්, මැතිවරනයට තරග කල සීඩබ්ලිව්සී අපේක්ෂකයන් 9 දෙනාගෙන් තේරී පත් වූයේ 3ක් පමනි. තවත් වෘත්තීය සමිතියක් වන කඳුරට ජනතා පෙරමුන එක ආසනයක් වත දිනා ගත්තේ නැත.

*ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ (කොප) නායක ඩිව් ගුනසේකර පුනරුත්ථාපන හා බන්ධනාගාර ඇමති ලෙස පත් කෙරුනි. නඩු විභාගයකින් තොරව "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස රඳවා ගෙන සිටින දහස් සංඛ්‍යාත දෙමල තරුනයන් සම්බන්ධ සෘජු වගකීම ඔහුට පැවරී ඇත. හිටපු ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් වූ ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප), කලින් විද්‍යා හා තාක්ෂන ඇමති තනතුර දැරූ, තිස්ස විතාරන මෙවර කැබිනට් මන්ඩලයෙන් හලා තිබේ. 1964 දී ශ්‍රීලනිප නායකත්වයෙන් යුක්ත ආන්ඩුවකට ඇතුල් වීම මගින් ට්‍රොට්ස්කිවාදී මූලධර්ම පාවා දුන් ලසසප දැන් පරඬැලක් බවට පත්ව ඇත. විතාරනට සිය ආසනය ලැබුනේ ජාතික ලැයිස්තුවෙන් වන අතර ලසසප තව එක ආසනයක් දිනා ගෙන තිබේ. ලසසප සහ කොප යන දෙපාර්ශ්වයම රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධයට ද කම්කරු පන්තියේ ජීවන මට්ටම්වලට එරෙහි ඔහුගේ ප්‍රහාරයන්ට ද මුලිමනින්ම සහාය දුන්හ.

ඊයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී, නව තරුන කටයුතු ඇමති ඩලස් අලහප්පෙරුම, මහ මැතිවරනයෙන් ආන්ඩුවට ලැබී ඇති "පෙර නොවූ විරූ ජනවරම" ගැන පුරසාරම් දෙඩීය. එජනිස පාර්ලිමේන්තුවේ ආසන 225න් 144ක් දිනාගෙන ඇතත්, එය පුහු ජයග්‍රහනයකි. ඡන්දය දී ඇත්තේ ලියාපදිංචි ඡන්දදායකයන්ගෙන් සියයට 61ක් පමනි, එය වනාහි වාර්තාගත වී ඇති අඩුම ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතයයි. එයට අනුව, එජනිසට ලැබී ඇත්තේ යන්තම් සියයට 34ක සහයෝගයක් පමනි.

නව සෞඛ්‍ය ඇමති මෛත්‍රීපාල සිරිසේන ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී කියාසිටි පරිදි, ආන්ඩුව අයවැය ගෙන එන ඇත්තේ, කලින් ඇඟවූ පරිදි මැයි මස නොව ජුලි මස ය. රාජපක්ෂ පසුගිය නොවැම්බරයේ දී ආන්ඩුවේ වියදම් පියවා ගැනීම පිනිස අතුරු සම්මත ගිනුමක් ඉදිරිපත් කිරීම මගින් අයවැය ජනාධිපති හා පාර්ලිමේන්තු මැතිවරන පැවැත්වෙන තෙක් කල් තැබීය. දැන් ජුලි මස සුලු-අයවැයක් ඉදිරිපත් කරන තෙක් මැයි හා ජූනි මස වියදම් පියවා ගනු වස් තවත් අතුරු සම්මත ගිනුමක් ගෙන ඒමට සැලසුම් කෙරෙයි.

කෙසේ වෙතත්, ජාමූඅ ඉල්ලා සිටින්නේ, පසුගිය වසරේ දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.7ක් වූ අයවැය හිඟය 2011 දී සියයට 5 දක්වා හරි අඩකින් පමන කප්පාදු කිරීමේ පිලිවෙත් ආන්ඩුව ක්‍රියාවට දැමිය යුතු බවයි. ආන්ඩුව 2009 වසර සඳහා අයවැය හිඟයේ ඉලක්කය වන සියයට 7 සපුරාලීමට අසමත් වූ බැවින් එය පෙබරවාරියේ දී සිය ඩොලර් බිලියන 2.6 නය මුදලේ තෙවන වාරිකය පමා කලේය. ඉදිරියේ දී මොන යම් හෝ මුදලක් ලබාදීමට නම් ඊලඟ අයවැයේ දී

සංයුක්ත සැලසුමක් අවශ්‍ය බව දැන් ජාමූඅ අවධාරනය කරයි.

රාජපක්ෂ ආන්ඩුව නව බදු පැනවීමත් අධ්‍යාපනය, සෞඛ්‍යය හා සුභසාධන වැනි අත්‍යවශ්‍ය සේවාවන් තව දුරටත් කප්පාදු කිරීමත් අරඹන බැවින්, ජාමූඅ ඉල්ලීම් දැවැන්ත පන්ති ගැටුම් සඳහා වේදිකාව සකසයි. රජය සතු ප්‍රධාන සංස්ථා පුද්ගලීකරනය කිරීමේ එහි ප්‍රයත්න දැනටමත් කම්කරුවන්ගේ විරෝධය අවුලුවා තිබේ. රටේ දැවැන්ත ආරක්ෂක යාන්ත්‍රනය මත රාජපක්ෂගේ දැඩි පාලනය ද පොලිස්-රාජ්‍ය හදිසි නීති බලතල දිගටම පවත්වා ගැනීමේ ඔහුගේ පිලිවෙත ද කම්කරු පන්තිය වෙතින් පැන නගින මොන යම් හෝ විරුද්ධත්වයකට එරෙහි යොදා ගැනෙනු ඇති මර්දන විධික්‍රම පිලිබඳ අනතුරු ඇඟවීමකි.

© www.wsws.org